# කලාකෙතට බට පැරණි පැවිදි පඬිරුවනක්

අලහේනේගම සුමනරතන හිමි

පැවිදි බවට පත් ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා ආරණ්‍යවාසී පාර්ශවයට හෝ ග්‍රාමාන්තරවාසි පාර්ශවයට හෝ බරවී ශාසනාභිවෘද්ධි මාර්ගයේ ගමන් කළහ. එයින් ආරණ්‍යවාසී භික්ෂූ කඳවුරට වඩා ග්‍රාමවාසී ඇතැම් තෙරවරු විසිතුරු කර්මයන්හි යෙදුණහ. සමහරු ග්‍රන්ථ නිර්මාණයන් කෙරෙහි බහුල වශයෙන් ප්‍රයත්නයක් දැරූහ. අනුරාධපුර යුගයේ සිට ඉන් මෙපිට යුග දක්වා කාලය සැලකිල්ලෙන් විමර්ශනය කරන කල භික්ෂූන් වහන්සේලා රැසක් ම ග්‍රන්ථකරණයෙහි යෙදුණහ. මෙම කාලවකවානු තුළින් අප විසින් මෙහි දී මතුකර පෙන්වන්නේ ගම්පොළ සාහිත්‍ය යුගයෙන් පසුව උදා කෝට්ටේ සාහිත්‍යෝදය පිළිබඳවය. එකල ශාස්ත්‍ර කලාවට බර වෑත්තෑවේ හිමි, වීදාගම මෛත්‍රීය හිමි, ධම්මදින්නාචරිය විමලකීර්ති හිමි ආදී පැවිදි පඬිවරු සමූහයක් ම වැඩ සිටියහ. [1]

මෙයින් අප විසින් වඩාත් ම කලා ක්ෂේත්‍රයට මහ සේවයක් කළ පඬිරුවනක් පිළිබඳව අවධානයට ලක් කෙරෙයි. ඒ ෂට්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල නම් වූ පැවිදි පඬිරුවනයි. උන් වහන්සේ සංස්කෘත, ප්‍රාකෘත, මාගධී හෙවත් පාලි, ශෞරශේණි, අපභ්‍රංශ. පෛශාචී ආදී භාෂාවන්ගෙන් අග්‍රප්‍රාප්ත වූහ.[2] උක්ත ෂට්භාෂා හැරුණු කොට ස්වභාෂාව වූ සිංහල භාෂාව පිළිබඳවත් ද්‍රවිඩ ආදී වෙනත් භාෂා පිළිබඳවත් මනා දැනුමක් පවතින්නට ඇතැයි අනිවාර්යෙන් ම තීරණය කළහැකිය. මෞර්ය වංශයට අයත් දෙමටාන කඳවුරු කුලයේ තොටගමුව නම් ප්‍රදේශය උන්වහන්සේගේ ග්‍රාමවරයයි.

ඒ බව කාව්‍යශේඛර මහා කාව්‍යයේ ද දැක්වෙන්නේ මෙසේය.

කුල ගම්ණි පිවිතු    රු
දෙමටාන ගමැ කඳවු    රු
තොටගමු වැසි සොඳු    රු
උතුරුමුල මහ තෙරිඳු මුනබු    රු

(23 පද්‍යය)

උක්ත පද්‍යයට අනුව උතුරුමුල (උත්තරමූල) මූලස්ථානයේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මුණුබුරා වන බවද පෙනේ.[3] මව



මෞර්ය රාජවංශයටත් පියා ස්කන්ධවාර වංශයටත් අයත්ව ජනයාගේ ගෞරවාදරයට ලක් වූවෝය.[4] පුංචි රාහුල පුත්‍රයාගේ පියා ලෙස සැලකෙන්නේ ස්කන්ධවාර හෙවත් මෞර්ය වංශයට අයත් වික්‍රමබාහු රජතුමාය.[5] සමහර තැන්හි වංශය සඳහන් වුවත් පුද්ගල නාමය සඳහන් නොවේ. රහල් කුමරු කුඩා කාලයේ දී ම පියා මියගොස් ඇති බැව් පෙනේ. තොටගමු රාහුල කුමාරයා උපන් නියම වර්ෂය පිළිබඳව සොයා ගැනීම දුෂ්කර වුවත්, කෝට්ටේ රාජ්‍ය අවධියේ හයවෙනි පැරකුම් කාලයේ හෙවත් ක්‍රි.ව. එක්දහස් හාරසිය ගණන්වල උපදින්නට ඇතැයි විශ්වාස කළ හැකිය. කුඩා කාලයේ දීම ස්වකීය පියා අහිමිවීමත් සමගම හැදීවැඩී ලොකුමහත් වූයේ හයවෙනි පැරකුම්බා මහරජු සෙවණේදීය. විනිත වත්, කාර්යසූර ලෙසත් වැඩුණු කුඩා රාහුල කුමරා කුඩා කල සිට ම කීමෙහි බිණීමෙහි අතිදක්ෂයෙක් විය.

දිනක් බිළිඳු වියේ දී රජතුමා මුණගැසුණු අවස්ථාවේ පුංචි ළමයා මෙසේ කීවේ රජතුමාද මවිතයට පත්කරවමිනි.

මාවැනි බිළින්    දා
වර වර ළඟට කැන්    දා
දුක්සැප කුමන්    දා
අසන නිරිඳෝ වෙන කොයින් දා [6]

කුමාරයා කුඩා කාලයේදී ම පැවිදි බිමට ද ඇතුළත් විය. ඒ තොටගමුවේ රහුල නමිනි. උන්වහන්සේගේ ගුරුහිමි වූයේ විදාගම මෛත්‍රී ( උතුරුමුල පාර්ශවය ) හිමියන්ය. මහනෙත් පාමුල පාර්ශවයට අයත් බුදුගුණ අලංකාරය ආදි ග්‍රන්ථ රචනා කළ වීදාගම මෛත්‍රී හිමියන් නොවන බව පෙනේ. රාහුල හිමියන් ශාස්ත්‍රය උගත්තේ පවා උත්තරමුල වීදාගම මෛත්‍රී හිමියන්ගෙන් බව ඇතමුන්ගේ අදහසයි.[7]

තොටගමුවේ රාහුල හිමියන් කුඩා කාලයේ ම කලා ශාස්ත්‍රයට දක්ෂ වූයේ **කතරගම කඳසුරිඳුගෙන්** ලැබුණු වරමක් නිසා බව පරෙවි සන්දේශයේ ද සඳහන් වෙයි.

කඳවුරු කුල උපන් රැළි තොටගමු    පියස
සෙද දත් සියල් කවිනළු මගද සකු    බස
කඳ කුමරිඳු වර ලද පසළොස්    වයස
වදහළ රහල් වැඩිතැන් කලරැව්    සඳෙස [8]

දේව වරම කෙසේ වෙතත් අවුරුදු 15 වන විට එම හිමියන් කලා ශාස්ත්‍රයේ දක්ෂයෙකු වූ බව මනාව පැහැදිලිය.

කුඩා රාහුල හිමියන් සහ උන්වහන්සේගේ ගුරු හිමියන් පිළිබඳව ගොඩනැගුණු ජනප්‍රවාද කථා රාශියක් පවති. මෙම දෙනම ස්වකීය විහාරස්ථානයේ ( තොටගමුව විය යුතුය. ) වැඩ සිටින කල දිනක් වීදාගම ගුරු හිමියන්ට ධර්මදේශනාවකට වැඩමවීමට නියමිතව තිබුණි. මේ අතර එම හිමි ඉතා වටිනා බලගතු තෛලයක් බඳුනක බහා ප්‍රවේශම් කර තබා ගත්තේය. ධර්මදේශනාවට වැඩමවීමට පෙර ලොම්ගසක් එහි පොඟවා එය සත්වරක් ගසා දමා දිවෙහි අතුල්වා ගත්තේය. ඒ දුටු ශිෂ්‍ය රාහුල හිමි ගුරු හිමි බණට වැඩිය පසු තෙල් බඳුන ගෙන පානය කෙළේය. බලසම්පන්න තෙලෙහි ආනුභාවයෙන් ශිෂ්‍ය හිමිනම සිහි මූර්ජා විය. මේ බව දැනගත් අසල්වාසී මිනිස්සු දිව ගොස් බණට වැඩි වීදාගම ගුරු හිමියන්ට දැන්වූහ. නැවත පන්සලට වැඩිය ගුරු හිමි ශිෂ්‍ය නම බෙහෙත් ඔරුවක වතුරවා බෙහෙත් කොට සුවපත් කෙළේය. පසු කාලයේ රාහුල හිමියන් ග්‍රන්ථ ධාරණයට අති දක්ෂයෙකු වුයේ මෙම තෛලය පානය කළ නිසා බව ජනප්‍රවාද මතයයි.[9] තොටගමුවේ හිමියන්ගේ දක්ෂතා පිළිබඳව ගෙතුණු තවත් කථා කීපයක් ම ජනප්‍රවාදයන්හි පවතියි.

තොටගමුවේ හිමියන් හෙළ කලා කෙතට සිදු කොට ඇති සේවා විවිධය. එයින් අද්‍යයතනයේ වඩාත් ම විද්‍යමානව පවතින්නේ සාහිත්‍ය සේවාව යටතේ ගණන් ගැනෙන ගද්‍ය හා පද්‍ය ක්ෂේත්‍රයන්ය. ගද්‍ය පාර්ශවය යටතේ මෞද්ගල්‍යායන පඤ්චිකාප්‍රදීපය පාලි-සිංහල ව්‍යාකරණ හා සම්බන්ධ පර්යේෂකයන්ට වර්තමානයේ ද බෙහෙවින් අගනේය. දඹදෙණි යුගයෙන් පසුව වටිනා ගද්‍ය කෘතියක් රාහුල හිමියන් අතින් නිර්මාණය වීම විශේෂ තම කාර්යයකි. ශක වර්ෂ 1379 දී (ක්‍රි.ව .1457) ලියන ලද පඤ්චිකා ප්‍රදිපයෙන් සංඥාධිකාරයේ සිට සන්ධි,විභක්ත්‍යාර්ථ,නාම, සමාස ආදිය දක්වා (1 පිට සිට 168 පිටුව දක්වා ) විස්තර වේ ගද්‍ය ගණයට ගණන් ගැනෙන කලා කෘතීන් හැරුණු කොට එදා මෙන් ම අදත් හෙටත් ගුරු-ශිෂ්‍ය සේ ම සාමාන්‍ය පාඨකයන්ගේත්,පර්යේෂකයන්ගේත් ඉමහත් සැලකිල්ලට පාත්‍ර වන්නේ පද්‍ය සාහිත්‍ය කෘතීන්ය. එම කෘතීන් නිර්මාණය කිරීම සඳහා උන්වහන්සේ සංස්කෘත-පාලි සාහිත්‍ය ආභාසය මෙන් ම සිංහල සාහිත්‍ය අත්දැකීම් ද මැනවින් ඉවහල් කර ගන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.



කෝට්ටේ සාහිත්‍ය යුගයේ සිංහලෙන් රචනා වී ඇති එක ම මාහාකාව්‍ය වන්නේ කාව්‍යශේඛර මාහාකාව්‍යයි. එම මහා කාව්‍යයට අභියෝග කිරීමට තරම් එකදු මහාකාව්‍යයක් හෝ කෝට්ටේ යුගයේ නිර්මාණය නොවීය. කාව්‍යශේකරයෙන් ප්‍රකාශ වන්නේ උන්වහන්සේගේ කාව්‍ය ධර්මදේශනාවක්ය. ඒ බව

තෙවලා දැන යෙහෙ න
දස අත යෙහෙන් හොබව න
විජයබා පිරුවන න
කියන බණ මේ අසව් සතොසි න [10]

( 1 සර්ගය 25 පද්‍යය. )

යන පදයයෙන්ද ප්‍රකාශ වෙයි. ලෝක ප්‍රකට උගතෙකු හා මහා සීලවන්තයෙකු බවද ප්‍රථම සර්ගයේදීම ප්‍රකාශ වෙයි.

සව්සත කෙළ පැමි ණි
ගුරුවන් දෙරණ සපැමි ණි
පිරිසිදු සිල් ගිහි ණි
සියල් ලෝ වියතුන්ට සිළුමි ණි [11]

( 1 සර්ගය 24 පද්‍යය. )

මුන්වහන්සේගේ භාෂාව ඉතාම සරලය. සේනක පඬිවරයාගේ ළදරු කාලය වර්ණනා කරන පද්‍යයෙන් ද ඒ බව පෙන්නුම් කරන්නේ මෙසේය

දත් කැකුළු පෑ ලා
සුරතල් සිනාසී ලා
බොළඳ බස් දී ලා
කෙළී සියලඟ දූලි ගා ලා [12]

( 3 සර්ගය 15 පද්‍යය. )

කාව්‍යශේඛරයේ රාහුල හිමියන්ගේ කවීත්වය ඔප්නැංවෙන, කලා කෞශල්‍ය දීප්තිමත් වෙන අවස්ථා බොහෝය.

පුන්සඳ වටාප ත
ගත උයදතින් නිසක ත
මඳ සුවඳ සිහිලො ත
පවන් හැම් පිනවමින් සත සි ත [13]

( 8 සර්ගය 31 පද්‍යය. )

රාත්‍රී නමැති කාන්තාව උදාගිරි පර්වතය නමැති අතින් පුන්සඳ නමැති වටාපත ගත් කල්හි සුවඳින් හා සීතලෙන් යුක්ත වූ මඳ සුළඟ සත්වයෙන්ගේ සිත පිනවමින් හමන්නට විය.

අක්ෂර නොදන්නා ගැමියනට පවා කාව්‍යශේඛර මහාකාව්‍යය උන්වහන්සේ විසින් සම්බන්ධ කිරීමට තරම් කලා ශූරයෙකු බව පහත පද්‍යයෙන් වුවද නොපෙනෙන්නේද?

ගුරු සිත නොරිද වා
වේලාව නොවරද වා
බැති පෙම් උපද වා
අකුරු උගනී කුමරු සොඳ වා [14]

( 5 සර්ගය 48 පද්‍යය. )

තොටගමුවේ හිමියන් සරල බසිනුත් සරල උපමාවෙනුත් කලාව රසවත් කරන්නේ මෙසේය.

කඳ කුමරිඳු ලෙසි ත
බමුණු පැටියත් සමගි ත
නොමඳ සව් ඉසුරෙ ත
වැඩිණි නවසඳ මෙන් දිනෙන් දි ත [15]

( 3 සර්ගය 16 පද්‍යය. )

තොටගමුවේ හිමියන්ගේ පද්‍ය කලාවේ සුවිශේෂී අංගයක් ලෙස සන්දේ ශකාව්‍යයන් දෙක සැලකිය හැකිය. එයින් ප්‍රථමයෙන් රචනා වූයේ පරෙවි සන්දේශ කාව්‍යයි. "පරෙවිය"හෙවත් "කලරැවි සඳෙස" රහල් හිමියන්ගේ ප්‍රථම සන්දේශ කාව්‍යයි. වයස අවුරුදු පහළොහේ දි පාලි, සංස්කෘතාදී භාෂාවන් ඉගෙන කතරගම කඳසුරිඳුගේ වරම් ලැබගෙන එය නිර්මාණය කළ බව ග්‍රන්ථයේ ම 208 වෙනි පද්‍යයේ සඳහන් වෙයි. හවෙනි පැරකුම්බා රාජ්‍ය සමයේ



එතුමාගේ දියණියක වූ චන්ද්‍රවතී දේවියට සුදුසු සැමියෙකු හා පුත්‍රුවනක් ලබා දෙන ලෙස දෙවිනුවර උපුල්වන් දෙවියන් වෙත පරෙවියෙකු අත යවන හස්නක් පිළිබඳව පරෙවිසන්දේශයේ සඳහන් වෙයි. ක්‍රි.ව. 1435 ත් 1440 ත් අතර කාලයේ රචනා වෙන්නට ඇතැයි සැලකෙන පරෙවි සඳෙස ජයවර්ධනපුර කෝට්ටේ සිට දෙවිනුවර දේවාලය දක්වා ගෙන ගොස් තිබේ.

පුරා දින හයක් ගමන් කෙරෙන පරෙවිසන්දේශය රහල් හිමියන්ගේ රචනා කලා නිර්මාණයේ අපරිණත බවක් ඇති බව ඇතැම් උගතුන් විසින් පෙන්වා දෙනු ලැබුවත් හෙළ කලා කෙතේ රසිකයන් පිනවන විවිධ ක්ෂේත්‍රයන්ට අයත් පද්‍ය කීපයක්ම රචනා වී ඇති බවක් පෙනෙන්නට තිබේ. [16]

පරෙවියා ගමන් කරන ගමන් මාර්ගයේ පියකරු ඇල්ගෙවිලියෝ වාසය කරති. ඉදුණු කෝවක්කා ගෙඩි, වැල්වල බබළයි. කවියා එය කලාත්මකව දකින්නේ මෙසේය.

එතැනින් තයන විලිකුන් කෙම් වැල සැදු ණු
සොබමන් එ ඇල්ගෙවි යෝනන්ගේ දිලු ණු
පැහැසත් දසන් වරණට හෙයිනි පැරදු ණු
විලසින් දිසෙයි ගෙල වැල ලා ගෙන එලු ණු [17]

( 63 පද්‍යය. )

එතැනින් තා යන කල්හි වැල්වල හටගත් කෙම් ගෙඩි ( කෝවක්කා ගෙඩි ) ශෝභමාන වූ ඒ ඇල්ගෙවි යුවතීන්ගේ බැබළුණු තොලට පැරදුණු හෙයින් ගෙල වැල ලා ගෙන එල්ලුණු ආකාරයෙන් පෙනෙයි.

කලා ලෝලීන්ගේ රසවත් භාවය උද්දීපනය කිරීමට උපමාවක් යොදා ගැනීමෙන් දියකෙළි වැනුම සාටෝපවත් කර ඇත්තේ පහත සඳහන් පරිද්දෙන්ය.

මත් තොස කර නරඹා කොමලඟකව ත
දුන් රසවත් රස පහරින් පිය උර ත
වත් සිහ තිය ඇත්කුඹු තල උරිරු යු ත
මෙන් මුතු දිසි දියබිඳු සහ කොකුම්මු ත [18]

( 96 පද්‍යය. )

රසවතෙකු කෝමල කාන්තාවකගේ මුහුණ බලා සිත සතුටු කොට ප්‍රිය වූ උරතලයට දෙන ලද උර පහරින් කොකුම් සහිත දියබිඳු සිංහයාගේ නිය වැදුණු ඇත්කුඹු තලයෙහි ලේ යුතු මුතු මෙන් පෙනිණි.

"නැටුම"යනු කලාකෙතෙහි දිදුලන මනෝනන්දනීය වූ පුද්ගල වශීකෘත අංශයකි. කාන්තාවන් ගී ගායනා කරමින් අත්පා විහිදුවමින් නැටුම් නටන ආකාරය ප්‍රේක්ෂකයාට රාහුල හිමියන් පෙන්වන්නේ මේ ලෙසිනි.

ලසිත ලලිත විදුලි සේය
දසිත ලියන් නොකම සේය
වසිත කියන ගී ර සේය
තසිත නොපටුවේ නො සේය [19]

ස්ත්‍රීන් බැබළුණා වූද , ලෙළ දෙන්නාවූද, විදුලිය මෙන් පෙනෙන කල්හි කියන ගීතයන්හි රසය නිරන්තරයෙන් වස්නා කල්හි තාගේ සිතෙහි සන්තෝෂය මහත් වෙයි.

තොටුගමුවේ හිමියන්ගේ කලා ක්ෂේත්‍රය වඩාත් කැපී පෙනෙන කාව්‍ය සාහිත්‍ය කෘතියක් වන්නේ සැළලිහිණි සන්දේශයයි. සිංහල සන්දේශ කාව්‍යයන් අතර අතිශයින් කීර්තිමත් වූ මෙම සන්දේශය හයවෙනි පැරකුම් රජුගේ දියණියක වූ උලකුඩය දේවියට දිගාසිරි ලබා දීම හා යහපත් පුත්‍රුවනක් ලබා දෙන ලෙස කැලණියේ විභීෂණ දෙවියන්ගෙන් කෙරෙන ඉලලීම ප්‍රකාශ කරයි. දූතයා සැළලිහිණියෙකු වන අතර සන්දේශය ගෙන යන්නේ ජයවර්ධනපුර කෝට්ටේ සිට කැලණිය දක්වාය. අඩුම පද්‍ය සංඛ්‍යාවකින් (පද්‍ය 108 කින්) වැඩිම ජනප්‍රියත්වයක් මෙයින් පෙන්නුම් කෙරේ. තොටගමුවේ රාහුල හිමියන්ගේ කලා කුසලතාවද මැනවින් පෙන්නුම් කරයි. [20]

ග්‍රන්ථය ආරම්භයේ සිට අවසානය දක්වාම සඳහන් වෙන සෑම කවියකින්ම රහල් හිමියන්ගේ පරිණත කලා කෞශල්‍ය මොනවට දිස් වෙයි. පාඨකයන්ට ජයවර්ධනපුර නගරය චිත්‍රයක් ලෙසින් පෙන්වන්නේ සදා මතකයේ රැදෙන අයුරිනි.

සැදි රත තඹර පෙළ රන තිසරුන් රුවැති
විදි දිය දහර ලෙල දෙන දිගු නරු පොටැති
රැදි රළ රළැති හොය දියවන්නා නමැති
ඇඳි පුර අඟන පටසලු සිරි රපැයි නිති[21]

( 08 පද්‍යය. )

රත් නෙලුම් පෙළින් සැරසුණු ස්වර්ණ හංසයන්ගේ රූප ඇති විසිරුණු ජලධාරා නමැති ලෙළ දෙන දිගු නරු පටක් ( නෙරිපොටක් ) ඇති රැඳුනා වු දියරළ නමැති රැළි ඇති දියවන්නා නම් ඔය ජයවර්ධනපුරය නම් කාන්තාව ඇඳි පට සළුවක ස්වභාවය දක්වීය.

ජයවර්ධනපුරයේ පවතින විවිධ ගොඩනැගිලිවල ඇති විසිතුරු අලංකාරය දකින බලන පුද්ගලයන්ගේ නෙත් සිත් වශී කරගන්නා ආකාරය මනා කලාකාමීත්වයෙන් ගෙනහැරපාන ආකාරය මෙසේය.

පැහැසරණිය මිණිපැමිණිය කොත් අග ට
බඳකිකිණිය දදගිහිණිය විමන් ව ට
නොවපැරණිය වනරමණිය විටින් වි ට
සැළලිහිණිය වදු කැලණිය පුරවර ට [22]

( 53 පද්‍යය. )

සැළලිහිණිය , මැණික්වල කාන්තිය කොත් මුදුනට විහිදුණු ප්‍රාසාදයන්ගේ හාත්පස රහු ( කිංකිණි )ගෙඩි බැඳි ධවජ ඇති පරණ බවට නොපැමිණ විටින් විට රමණිය වන්නා වූ කැලණි පුරයට පැමිණෙන්න.

සැළලිහිණියාට සඳෙස රැගෙන යන අතර මඟදී කැලණි දෙවොලේ කලාත්මකව ප්‍රේක්ෂක සිත් පැහැර ගෙන දෙව්විමනක් මෙන් ඉතා අලංකාර ලෙස රංගනය කරන කාන්තාවන්ගේ ආකාරය සිත්තමකට පාඨකයා හමුවේ රාහුල හිමියන් විසින් ගෙනහැර පා ඇත්තේ මෙපරිද්දෙනි

විදෙන ලෙළන නරුබර පුළුලුකුල රැ දී
හෙලන නගන අත නුවනග හැලුම් දි දී
රුවින දිලෙන අබරණ කැලුම ගත යෙ දී
සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැ දී [23]

( 74 පද්‍යය. )

විහිදී සෙලවෙන නෙරිපට පළල් උකුලේ රැඳුණ , නෙත් කොණින් බලමින් අත් උස් පහත් කරන්නා වූ අබරණ රැස් ඇඟ වැදී රූපයෙන් බබළන නර්තනයේ යෙදෙන ස්ත්‍රීහු සෙලවෙන පහන් දළු වැනි වෙති.

හිරු බැස යාම සෑම දිනකම සන්ධ්‍යාභාගයේ දක්නට ලැබෙන සාමාන්‍ය සිරිතකි. හිරුගේ බැස යාමේ දී එහි ස්වරූපය, අහසේ වර්ණය රසඥතාවයෙන් යුතු ඕනෑම අයෙකුට කලාත්මකව විඳගත හැකිය. ඒ අනුව එහි ඇති කලාත්මක භාවය රාහුල හිමියන්ගේ කලා ඇසින් උපමා උදාහරණ ද සහිතව බලන්නේ මේ පරිද්දෙනි.

වදිමින් සවස නල හැසිරෙන දිගතුව ල
සොබමන් සුනිල් මිණි නිල් නුඹ තුරු විපු ල
පතසන් අවරගිරි නැටියෙන් වැටෙන ක ල
විලිකුන් සුරත් පල වැනිවේ රිවි මඩ ල [24]

( 48 පද්‍යය. )

හිරුමඬල නිල් මැණිකක් සේ ඉතා නිල් අහස නමැති ගසෙහි දිසා නමැති අතුවල සවස හමන සුළඟ වැදී අපරදිග පර්වත නමැති නටුයෙන් වැටෙන ඉදුණු රතුපාට ගෙඩියක් වැන්න.මෙවැනි ම සොබා සොඳුරු ගැමි පරිසර කලා කෙතට රහල් හිමියන් බැස ඇත්තේ මෙසේය.

අවට සුපිපි සපු දුනුකේ සලලා න
හ~න තැනින් තැන විලිකු┘ කිරළා න
පැසී නැමී කරල් රත්හැල් සහළා න
වඩින මැනවි මහ වෙළ මැද වෙරළා න [25]

( 40 පද්‍යය. )

මිතුර, හාත්පස හොඳින් පිපුණ සපු, දුනුකේ, හොර ගස් ඇති තැන් තැන්වල නාද කරන වලිකුකුළන් හා රත්හැල් ඇති වෙරළාන නම් මහවෙළ මැදින් යනු මැනවි.

මෙසේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් කලා කෙතට බසිමින් හෙළ කලා කෙත සරු කරන්නට ක්‍රියා කිරීම අනාගත පැවිදි පරපුරට ම සිදු කළ මහගු ආදර්ශයකි. මනා මග පෙන්වීමකි.



## පාදකසටහන්


1. ගුණසේකර බන්දුසේන, සිංහල සාහිත්‍යය කෝට්ටේ යුගය සහ එතැන් සිට, ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 1996, 29-39 පිටු.
2. දසනායක සුමනසිරි, කෝට්ටේ සහ සීතාවක යුග, වාසනා ප්‍රකාශකයෝ, දංකොටුව, 2005, 75 පිටුව.
3. කාව්‍යශේඛර මහාකාව්‍යය, සංස් රත්මලානේ ධර්මාරාම හිමි, 4 වෙනි මුද්‍රණය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලය, කැළණිය, 1966, 1-10 පිටු.
4. විජිත හිමි ඇඹිලිපිටියේ, කෝට්ටේ යුගයේ සංදේශ විවරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2003, 4-7 පිටු
5. ගමගේ එස්.අයි, කෝට්ටේ සාහිත්‍ය යුගය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2012, 30 පිටුව.
6. වික්‍රමසිංහ. කේ.ඩී.පී.,සිංහල ලේඛක පරපුර, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 2 මුද්‍රණය, 1964, 324 පිටුව.
7. එම, 328-329 පිටු.
8. විමර්ශන සහිත පරෙවි සන්දේශය, සංස් කේ. ජයතිලක, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12, 1997, 101 පිටුව.
9. සිංහල ලේඛක පරපුර, 329-330 පිටු
10. කාව්‍යශේඛර මහාකාව්‍යය සංස් රත්මලානේ ධර්මාරාම හිමි, 4 වෙනි මුද්‍රණය, ,10 පිටුව.
11. එම, 10 පිටුව.
12. එම. 65 පිටුව.
13. එම, 149 පිටුව.
14. එම, 101 පිටුව.
15. එම, 66 පිටුව.
16. පරෙවි සන්දේශය, සංස් සිරි තිලකසිරි, රත්න පොත්ප්‍රකාශකයෝ,කොළඹ 10, 2005,XVIII-XXVII පිටු.
17. එම, 169-170 පිටු.
18. එම, 232-233 පිටු.
19. එම, 363-364 පිටු.

20. විතානගේ සිරිසේන, සංදේශ විවරණය, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ 10, 2001, 115-121 පිටු.

21. සැළලිහිණි සංදේශය, සංස්: වී.ඩී.එස්. ගුණවර්ධන, සමයවර්ධන පොත් සමාගම, කොළඹ 10. 2006. 42 පිටුව.

22. එම, 91 පිටුව.

23. එම, 111 පිටුව.

24. එම, 86 පිටුව.

25. එම, 78 පිටුව.